# එක්වීම වෙන්වීම සහ විරුද්ධ වීම



සිරිවිමල මුතුකුමාරණ
ඩැන්ඩිනොං

අප ගේ බස් වහරෙහි එන ජන සමාජයට බොහෝ සෙයින් බලපාන ගුණාංග තුනක් ගැන විමසා බැලීමට සිත් වියැ. මේ ගුණාංග තුන එකින් එක ගෙනැ බලන විටැ, ඒ සැමෙකැකින්මැ හොඳ මෙන් මැ නොහොඳ ද සිදුවන බවක් පෙනෙන්නට තිබේ.

මිනිස් ගතිගුණ තුළට යාමට පෙරැ, මෙම ගුණාංග තුන සොබා දහම කෙරෙහි බලපා ඇති අයුරු ද සිතා බැලීම යහපත් පිවිසුමක් බව පෙනේ. අපි කිසියම් බීජයක් තුළින් බිහිවන පැලෑටියක් දෙසැ බලමු. බොහෝ පැලෑටිවලැ අතුපතර හැදෙන විටැ එකට එකක් දුර වෙමින් විහිදී යාමක් පෙනෙයි. අඹ ගස සහ කොස් ගස මෙයට නිදසුන් යැ. පොල් ගසෙහි සහ කිතුල් ගසෙහි ඇත්තේ මෙයට හාත්පසින් වෙනස් අයුරෙකි. අතුපතර විහිදෙතත් එකින් එක දුර වීමක් එහි නැත.

අඹ ගසෙහි සහ කොස් ගසෙහි ද පොල් ගසෙහි මෙන් එක මැ කඳෙකැ අතු නො බෙදී තිබුණි නම් එහි හටගන්නා පලදාව ඉතා සුළු වියැ හැකි වැ තිබුණි. අතුපතර විහිදෙන (වෙන්වන) නිසා අතු-රිකිලි දිගේ ද පල දරන සැටි අපට පෙනෙයි. පොල් ගසෙහි අතුපතර නැති වැ එක මැ කඳෙකැ පල දරණ හෙයින්, ගසට නැගැ ගත් තැනැත්තාට අතැ දුර දිග ඇතුළතැ සියලු මැ පලදාව නෙළා බිමට බැසියැ හැකි යැ.

මෙම දෙ වගයට මැ වෙනස් වූ තවත් ගස් වෙසෙසක් තිබේ. ඒවා හිතුමතේ වැඩෙන්නට නො දී, ඊට විරුද්ධව වෙමින් වැඩීමට බාධා කිරීමෙන් උපරිම ඵල ලබා ගත හැකි යැ. එයට හොඳ මැ නිදසුන තේ ගසයි. තේ ගසෙකැ නැඟෙන නැඟෙන දළුව කඩා දැමීමෙන් ලැබෙන ඵල දෙකෙකි. කඩා ඉවත් කරැ ගත් දළු තේ පානය සඳහා යොදා ගන්නා අතරැමැ, දළුව කැඩුණු තැනින් තවත් රිකිලි කිහිපයක් ඇති වීම සිරිතයි. එතැනැ දී සිදු වනුයේ ගසේ හැදීමට බාධා කිරීම (විරුද්ධ වීම) ගසට මෙන් මැ ගස වගා කළ තැනැත්තාට ද වාසිදායක වීමයි.

සොබා දහම තුළින් අප දකින මෙම එක්වීම-වෙන්වීම සහ විරුද්ධ වීම යන ගුණාංගයන් මිනිස් සමාජය කෙරෙහි බලපා ඇති අයුරු කෙසේදැ යි විමසා බැලීම මගේ ලිපියෙහි අරමුණ වේ. සිංහල ජන සමාජය තුළැ බොහෝ කලකට පෙරැ පැවැති සිරිතක් වූයේ 'එක ගෙයි දීගය' යි. එයින් අදහස් කෙරුණේ සහෝදරයින් දෙතුන් දෙනෙකු සිටින පවුලකට එක මනාලියක් පමණක් ගෙනැ ඒම යැ. එවිටැ එම නිවස තුළැ පවුල් දෙක තුනක් වීම වළකින සේ මැ පවුලේ දේපල දෙතුන් කොටසකට බෙදී යාම ද වළකියි. එදා පැරැන්නන් දුටුවේ එම ක්‍රමය පවුලෙකැ දියුණුවට හිතකර වන බවයි. එම සිරිත එදා යහපත් සේ දුටුව ද, කල් යාමේ දී එය පෙනුණේ සදාචාරාත්මක ලෙසැ එය නුසුදුසු ක්‍රමයක් බවයි. එය මිනිස් ප්‍රජාවේ දියුණුවට ද අහිතකර බව පෙනුණි. ඉන්පසු සමාජගත වූ විවාහ ලේඛණගත කිරීමේ ක්‍රමය අනු වැ පවුලෙකැ එක-එක් පිරිමි දරුවා වෙනත් පවුලෙකින් සහකාරියක් සොයා ගැනීම ප්‍රචලිත වියැ. මෙය සහෝදරත්වය කැඩී-බිඳී යාමේ මඟක් වූ බව පෙනෙතත්, වෙන්-වෙන් පවුල් ඒකක බිහිවීම නිසා සමාජය වැඩි දියුණු වූ බව පිළිගත යුතු වැ තිබේ.

පවුලකට අයත් ඉඩකඩම් ආදී දේපල බෙදා වෙන් කිරීමේදී සහෝදරයින් අතරැ බොහෝ විරසකවාදීකම් ඇති වූ සැටි අප දැකැ තිබේ. නීති මඟින් විසඳුම් සොයා ගියා සේ මැ, අතැ පයැ සවිය පෙන්වා තම සිතැඟි ඉටු කරැ ගත් අවස්ථා ද දැකැ තිබේ. ඇතැම් විටැ මිනීමැරුම් ද ඒවායේ අතුරු ඵලය වී තිබේ. ඒ ලියැවුණේ ලිපි සිරසෙහි එන විරුද්ධවාදීකම් ගැන යැ.

ඇතැම් පවුල්වැලැ සහෝදරයින් අතරින් එක් පුද්ගලයෙකු සුරාව, සූදුව වැනි දුරාචාරයකට ඇබ්බැහි වූ විටැ පවුලේ දනය විනාශ වී යාමේ තර්ජනයක් ඇති වෙයි. මෙයට නො කැමති ඉතිරි සහෝදරයින් කිසියම් කලක් ඉවසා සිටියත්, හැමදාමත් එසේ කළ නො හැකි තැනට කටයුතු සිදුවීම සිරිතෙකි. ඉන්පසු වැ සිදු වන්නේ දුසිරිතට පුරුදු වූ සහෝදරයාට එරෙහිව නීති විරෝධි හෝ නීතිප්‍රකාර පියවර ගැනීමයි.

ඉහත දැක්වුණු නිදසුන් අනු වැ බලන විටැ මිනිස් සමාජයට එක්වීම-වෙන්වීම-සහ විරුද්ධවීම යන ගුණාංග යන් මුළුමනින් මැ පිටුදැකියැ නොහැකි බවක් පෙනෙන්නට තිබේ. එමනිසා එම ගුණාංග තුන මැ ලොවෙහි එක්-එක් ජාතීන් අතරැ මෙන් මැ, එක මැ දැයෙකැ පුරවැසියන් අතරැ ද විවිධ අයුරු බලපා තිබේ. ජාතීන් වශයෙන් බලන විටැ එක්තරා කලෙකැ මහ බලවතෙක් වූ සෝවියට් රුසියාව අද වෙන් වශයෙන් ඈත් වී ගිය ජාතීන් කිහිපයක් වී තිබේ. අප්‍රිකා මහාද්වීපය තුළැ එදා තිබුණු තත්වය වෙස් වී, අද එකිනෙකට වෙනස් වූ රටවල් බොහෝ ගණනකට තෝතැන්නක් වී තිබේ.

අප ගේ නිජ බිම ගැන සලකා බැලුව ද තත්වය එසේ මැ යැ. විදේශික රජයෙකැ බලපෑම් වලින් මිදී, අපගේ රට නිදහස් වූ පසු පිහිටුවා ගන්නා ලද රජයෙහි සිංහල-ද්‍රවිඩ-මුස්ලිම් ආදී වූ ජාතීන් කිහිපයක් එක් වී සිටිය හ. එහෙත් කල් යාමේ දී ඔවුහු එක්-එක් අතට බෙදී වෙන් වීම යහපත් බව දුටුවහ. දේශපාලන පක්ෂ වශයෙන් බැලුව ද තත්වය එසේ මැ යැ. වසර 1950 පමණ වන විටැ මහා හඬක් නඟමින් අත්වැල් අල්ලා ගත් රතු බලමුළු පියවරෙන් පියවර දිය වී ගියේ යැ.

මිනිස් සමාජය තුළැ වරින්වරැ මුහුණුවර වෙනස් කරමින් සිදුවන ඉහත සඳහන් වියවුල් තත්වය ඇති වීමට හේතුව කුමක් දැයි සොයා බැලීම යහපත් පිවිසුමක් බව පෙනේ. මා දකින අයුරු නම් මෙය මිනිස් හදවත් තුළැ ලියලා වැඩෙන අසීමිත ආසාව නිසා ඇති වන ප්‍රතිඵලයකි. ජාතීන් අතරත්, සමාජයේ විවිධ සංවිධාන අතරත්, පවුල් සංස්ථා තුළැ පුද්ගලයින් අතරත්, එක මැ මව් කුසින් බිහි වූ සහෝදරයින් අතරත් සමඟිය බිඳී යනුයේ ආත්මාර්ථකාමිත්වයේ බලපෑම නිසා බව බොහෝ විටැ පැහැදිලි වී තිබේ.

බුදුවරයෙකු ලොවැ පහළ වනුයේ මෙම විනාශකාරී මූලධර්මය යටපත් කරැ ලීමට යැ. සෑහීමට පත්වීම බුදුනු ප්‍රතිපදාවේ ප්‍රධාන මැ ලක්ෂණය යැයි හැඟේ. විවිධ අරමුණු ඔස්සේ පැනැ නඟින ආසාව සෑහීමට පත්වීම නම් වූ අවියෙන් ඔප මට්ටම් කරැගත් පසු ආත්මාර්ථකාමිත්වය ලිහිල් වී යන සැටි අපට දැකැ ගත හැකි යැ. එමනිසා වත්මනෙහි හිස් ඔසවා එන 'කා-කොටා ගන්නා' ප්‍රවණතාවය යටපත් කිරීමට නම් සෑම හදවතක් තුළැ මැ සෑහීමට පත් වීමේ උතුම් ගුණාංගය ප්‍රගුණ කළ යුත්තේ මැ යැ. එය සපුරා ගැනීම 'අනිකා' පිට නොපටවා 'තමා' වෙතැ මැ රඳවා ගැනීම සංහිඳියාවේ කෙටි මැ මඟයැ යි සිතේ.

*සියලු සත්වයෝ සෑහීමට පත්වෙත්වා !*

## පාළි පාඨ හෙළ බසින් - 51

''අප්පමත්තෝ අයං ගන්ධෝ
යායං තගරචන්දනී
යෝ ච සීලවතං ගන්ධෝ
වාති දේවේසු උත්තමෝ''
(ධම්මපද 56 - පුප්ඵ වග්ග)

සියලු මල්වලැ සුවඳ
පමණින් අල්ප වේ මැයි
සිල්වත් ගුණ සුවඳ
දෙව් ලොවට ද හමා යයි

සිරිවිමල මුතුකුමාරණ
ඩැන්ඩිනොං

For all your Adevertising needs
Mihirie Dissanayake
0414 546 833
mihirie@pahana.com.au